ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024.11.11

1. වී. දනූෂා
   කන්දසාමි කෝවිල ළඟ,
   කෝපායි මධ්‍ය,
   නව ජනපදය, අරාලි වීදිය,
   යාපනය.

2. වී.සාම් (ශිෂ්‍ය)
   යා/ශාන්ත අන්තෝනි විදුහල,
   කයිට්ස්.

**(පැමිණිලිකරුවන්)**

1. සන්ජිකා බාලසුබ්‍රමනියම්
   ගුරුවරයා
   යා/ශාන්ත අන්තෝනි විදුහල,
   කයිට්ස්.

2. පූජ්‍ය ඇන්ටන් අමලදාස්
   විදුහල්පති
   යා/ශාන්ත අන්තෝනි විදුහල,
   කයිට්ස්.

**(වගඋත්තරකරුවන්)**

**පැමිණිලි අංකය: HRC/JA/077/2021**

**පැමිණිල්ල**

කයිට්ස්, ශාන්ත අන්තෝනි විද්‍යාලයේ 9(A) ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙකු වන විනෝජන් සාම්ගේ පැමිණිල්ලට අනුව 2021.04.20 වන දින පාසලේ ඉංග්‍රීසි ගුරුවරිය වන සන්ජිකා බාලසුබ්‍රමනියම් යන අය විසින් පහරදීම සම්බන්ධයෙන් 2021.04.28 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය ප්‍රාදේශීය කාර්යාලයට පැමිණිල්ලක් ලැබී ඇත.

2022.04.20 වන දින ඉහත කී ඉංග්‍රීසි ගුරුවරිය පන්තියට පැමිණෙන විට සිසුන් සියලු දෙනාම නැඟිට 'ගුඩ් මෝර්නින්' යනුවෙන් පවසා පසුව සියලු දෙනා අසුන් ගැනීමේදී තමන් ද අසුන් ගත් බව පැමිණිල්ලේ සඳහන් වේ. මේ අවස්ථාවේ තමන් අසලට පැමිණි ගුරුවරයා තමන්ගෙන් නැගිට්ටේ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නැත්තේ මන්ද, ඔහුට ආචාර නොකළේ මන්ද යැයි විමසා ලීයකින් පහර දුන් බව ද පැමිණිල්ල තුළින් දක්වා ඇත.

තවද, එකී ගුරුවරිය තමාට පහර දෙන විට ලීයේ කොටසක් ඇසට වැදීම නිසා ඇසට වේදනාවක් ඇති වූ බවත්, ඒ අවස්ථාවේ ගුරුවරිය ඒ පිළිබඳව කිසිවක් නොඇසූ බවත්, තමන් වහාම නැඟිට ඇස සෝදන්නට යන බව පවසා ගිය බවත්, එම අවස්ථාවේ තමන් සමඟ පැමිණි මිතුරා තමාගේ ඇස ඉදිමී රතු වී ඇති බව පැවසූ බවත් පැමිණිල්ලෙහි සඳහන් කර ඇත. මේ බව තම පන්ති භාර ගුරුවරයා වන ප්‍රදීප් මහතාට පැවසූ විට ඔහු පවසා ඇත්තේ තමන් සතුව තිබූ වතුරෙන් ඇස සෝදාගෙන පන්ති කාමරයට යන ලෙස ය. කාල සටහනේ 7 වන කාල පරිච්ඡේදයේ දී තමාට කතා කර ඇසේ වේදනාව තිබේද යන්නත්, එක් ඇසක් වසා ගෙන බලන ලෙසත් පැවසූ බවත්, ඒ අවස්ථාවේ තමා විසින් බැලීමට අපහසු බව පැවසුවත්, එය ටික වේලාවකින් යථා තත්ත්වයට පත්වනු ඇති බව පවසමින් ඔහු තම නේවාසිකාගාරයට ගිය බවත් සඳහන් කර ඇත.

පසුව මේ පිළිබඳව නේවාසිකාගාරයේ භාරකරු හා විදුහල්පති ඇන්ටන් අමලදාස් මහතාට පැවසූ විට තව ටික වේලාවකින් හොඳ අතට හැරෙන බව පවසා නේවාසිකාගාරයට යැවූ බව ද පැමිණිල්ල තුළින් දක්වා ඇත. පසුව පස්වරු තුනට පමණ උසස් පෙළ සිසුවෙකු සමඟ තමාට රෝහලට යන ලෙසත්, වෛද්‍යවරයාට ගුරුවරියගේ පහරදීම ගැන නොකියන ලෙසත්, ක්‍රීඩා කරමින් සිටියදී මෙම සිදුවීම සිදුවූ බවත් පවසන ලෙස තමාට කියූ බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර බෙහෙත් ලබා දී ඇති අතර, පසුව නේවාසිකාගාරයට පැමිණ සිසුවෙකුගේ දුරකථනයෙන් සිද්ධිය තම මවට දන්වා ඇති අතර පසුව එදින රාත්‍රී **8.00** ට පමණ විදුහල්පතිවරයා තමාට කතා කර ඔහු හට නොදන්වා සිදු වූ දේ පිළිබඳ නිවසට පැවසීම පිළිබඳව විමසමින් තමාට තල් පිත්තකින් කිහිප වතාවක්ම පහර දුන් බව සඳහන් කර ඇත.

මෙම තත්ත්වය තුළ 2021.04.22 වන දින තම මව පාසලට පැමිණ මේ පිළිබඳව පාසලේ විදුහල්පතිවරයාගෙන් කරුණු විමසා ගොස් ඇත. මේ සම්බන්ධයෙන් පාසලේ විදුහල්පතිවරයා විසින් වැරදි තොරතුරු මවට දන්වා ඇති බව තමා විසින් මවට පැවසීමෙන් පසුව 2021.04.23 වන දින පාසලට පැමිණි මව, තමා පාසලෙන් රැගෙන ගොස් ඍජුවම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යාපනය මහ රෝහලට ඇතුළත් කළ බවත්, එකී රෝහලේ දින දෙකක් ප්‍රතිකාර ලබාගත් බවත් 2වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය විසින් ලබාදුන් වාචික ප්‍රකාශයේ සඳහන් වේ.

2වන පැමිණිලිකරුගේ මව වන 1වන පැමිණිලිකාරිය වන විනෝජන් දනුසා යන අය විසින් තම පුතා වන විනෝජන් සාම් හට පාසලේදී ගුරුවරියක විසින් පහර දී ඇති බවත්, එලෙස පහරදීමේදී ඔහුගේ ඇස ආසන්නයේ තුවාලයක් සිදු වී ඇති බවත්, එම තුවාලය රෝහලට පෙන්වීමට ගිය අවස්ථාවේ එය සිදුවූ ආකාරය සඟවා බිම ඇද වැටීම නිසා තුවාල සිදුවූ බව පවසන ලෙස පාසලේ විදුහල්පතිවරයා පැවසූ බවත් තම පුතා දුරකථනයෙන් තමාට පැවසූ බව ප්‍රකාශ කර ඇත.

තවද, පාසලට ගොස් තම පුතා හමුවූ අවස්ථාවේදී තම පුතා, ෆාදර් (පාසලේ විදුහල්පති) ඔහුට පහර දෙන බවත්, පාසලේ සිදුවූ දේ දුරකථනයෙන් පැවසූ නිසා නුසුදුසු වචනවලින් බැණ වැදුණු බවත් කියමින් හඬා වැටුණු බවත් 1වන පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. තමා විසින් පුතා රැගෙන ඉංග්‍රීසි ගුරුවරිය ළඟට ගොස් ගුඩ් මෝර්නින් නොකියූ නිසා පහර දීම පිළිබඳව විමසූ බවත්, එයට එම ගුරුවරිය මෙය සෑම පාසලකම සිදුවන බවත්, එය විශාල ප්‍රශ්නයක් කර නොගන්නා ලෙස පැවසූ බවත් දක්වා ඇත.

පසුව විදුහල්පතිවරයා ළඟට ගොස් කරුණු විමසූ විට, විදුහල්පතිවරයා ගුරුවරයා පහර දීම වැරැදි බවත්, එම ගුරුවරයා මාරු කරන බවත්, එම පාසලේම පුතාට දිගටම ඉගෙන ගන්නා ලෙසත් පවසා තමාට නිවසට යන ලෙස පැවසූ බවත් 1 වන පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

එදින රාත්‍රියේ තම පුතා සමඟ කතා කළ අවස්ථාවේ පාසලේ විදුහල්පතිවරයා තමාට පහර දුන් බවත්, සියලු ගුරුවරුන්ගෙන් සමාව ගන්නා ලෙස පුතාට පැවසූ බවත් ඔහු පවසන ලද බව සඳහන් කර ඇත. පසු දින පුතා පාසලෙන් කැඳවාගෙන ගොස් යාපනය ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පොලිසිය විසින් පුතාගෙන් ප්‍රකාශයක් ලබා ගත් බව වාචික ප්‍රකාශයේ සඳහන් වේ.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

**1 වන වගඋත්තරකාරිය වන සන්ජිකා බාලසුබ්‍රමනියම්, යා/ශාන්ත අන්තෝනි විදුහල, කයිට්ස්.**

කයිට්ස්, යා/ ශාන්ත අන්තෝනි විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරුවරිය වන සන්ජිකා බාලසුබ්‍රමනියම් යන අය විසින් අදාල පාසලේ තමන්ට විෂය කාල පරිච්ඡේදයක් නොමැති නිසා වෙනත් පන්තියකට එනම්, 9 (A) පන්තියට ඉගෙන්වීම සඳහා යන විට එම පන්තියේ ඝෝෂාකාරී බව පවසා සිසුවෙක් තමන් වෙත කෝටුවක් ලබා දුන් බවත්, ඒ අවස්ථාවේ අදාල සිසුවා (2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම්) හට පහර දුන් බවත්, ඒ අවස්ථාවේ වැරැදීමකින් ඔහුගේ ඇසට වැදුනු බවත්, පසුව ඇස රතුවූ බවත්, ඇස සෝදා ගැනීමට වෙනත් සිසුන් සමඟ යැවූ බවත්, ඔහුව පන්ති කාමරයට ගෙනැවිත් මේසය මත විවේක ගැනීමට සැලැස්වූ බවත් ප්‍රකාශ කර ඇත. පාඩම අවසන්වීමෙන් පසු තමා වෙනත් පන්තියකට ගිය බවත්, සිසුවාගේ පන්ති භාර ගුරුවරයාට කාරණය දන්වා ගිය බවත්, එදින තමාට කිසිඳු ගැටලුවක් නොවූ බවත් පාසල නිමවී නිවසට ගිය බවත් දක්වා ඇත.

පසුව මීළඟ සතියේ පාසල ආරම්භ වන විට සිසුවා පාසලෙන් කැඳවාගෙන යාමට ඔහුගේ මව පැමිණ ඇති අතර එදින සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් සිසුවාගෙන් තමන් සමාව අයැද සිටි බවද සඳහන් කර ඇත. පසුව එකී සිසුවා පොලිසියට කළ පැමිණිල්ලකට අනුව තමා ගෙන් ප්‍රශ්න කළ බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**2 වන වගඋත්තරකරු වන විදුහල්පති, පූජා ඇන්ටන් අමලදාස්, යා/ශාන්ත අන්තෝනි විදුහල, කයිට්ස්.**

කයිට්ස්, යා / ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පති ඇන්ටන් අමලදාස් මහතාගේ ප්‍රකාශයට අනුව, සිද්ධිය සිදු වූ දිනයේ ප.ව. 1.45 ට පමණ අදාල සිසුවා නොවාසිකාගාරයට ඇතුළුවීමේ දී තමන්ට ඉංග්‍රීසි ගුරුවරිය පහර දුන් බවත්, ඇසට වැදුනු නිසා ඇස රිදෙන බවත් පැවසූ නිසා උසස් පෙළ සිසුවෙකු සමඟ කයිට්ස් රෝහලට යැවූ බවත් සඳහන් කර ඇත.

ඉන් පසු එදින රාත්‍රියේ තමන් නොදැනුවත්ව 2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන සිසුවා විසින් ඔහුගේ මවට දුරකථනයෙන් කතා කිරීම සම්බන්ධයෙන් තමන් සිසුවාට දඬුවම් කළ බවත්, පසුදින පාසලට පැමිණි එකී සිසුවාගේ මව වෙත කාරණය පැහැදිලි කර සමාදානයෙන් පිටත් කර හැරිය බවත්, නැවත 2021.04.23 වන දින මව පාසලට පැමිණ සිසුවා රැගෙන ගිය බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

1වන පැමිණිලිකාරියගේ දරුවා වන 2වන පැමිණිලිකරු යා/ශාන්ත අන්තෝනී විද්‍යාලයේ ශිෂ්‍යයෙකු බවත්, 2021.04.20 වන දින විද්‍යාලයේදී 1 වන වගඋත්තරකාරිය වන සන්ජිකා බාලසුබ්‍රමනියම් යන ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන ගුරුවරිය විසින් 02 වන පැමිණිලිකරුහට පහර දීමක් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එකී පහර දීම කෝටුවකින් සිදු කර ඇති බවත්, එහිදී එම කෝටුව 2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අයගේ ඇසක වැදී ඇස රතුවී ඉදිමී ඇති බවත්, 1වන වගඋත්තරකාරිය විසින් ඒ පිළිබඳව නිසි අවධානයක් යොමු කර නොමැති බවත් නිරීක්ෂණය වේ. කෙසේ නමුත්, අදාළ පහර දීම සිදු කළ අවස්ථාවේදී එම කෝටුව 2 වන පැමිණිලිකරුගේ ඇසක වැදුණු බව 1වන වගඋත්තරකාරිය විසින් පිළිගෙන ඇති බව ද නිරීක්ෂණය වේ.

2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය විසින් 2වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා හට අදාළ පහර දීම සම්බන්ධයෙන් දැනුම් දෙනු ලැබූ මුල් අවස්ථාවේ දී ඔහු විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන 2වන පැමිණිලිකරුව නේවාසිකාගාරය වෙත යවා ඇති බවත්, පසුව සවස සවස 03 ට පමණ පාසලේ වෙනත් ශිෂ්‍යයෙකු සමඟ 2 වන පැමිණිළිකරු වන විනෝජන් සාම් යන අය කයිට්ස් රෝහල වෙත යවා ඇති නමුත්, වෛද්‍යාවරයා වෙත ගුරුවරයෙකුගේ පහර දීමක් හේතුවෙන් එසේ ඇසට තුවාල සිදුවූ බව නොපවසන ලෙසට 2 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා විසින් උපදෙස් ලබා දී ඇති බවත් පෙනී යයි.

එසේම, රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගෙන පැමිණීමෙන් අනතුරුව 2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය විසින් තමා මුහුණ දුන් සිදුවීම පිළිබඳව තම මව වන 1වන පැමිණිලිකාරිය හට

දුරකථනය ඔස්සේ දැනුවත් කර ඇති බවත්, එලෙස 2 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයාගේ අනුදැනුමකින් තොරව අදාළ සිදුවීම පිළිබඳව මවට දැන්වීම හේතුවෙන් 2 වන වගඋත්තරකරු විසින් 2 වන පැමිණිලිකරු හට පහර දීමක් සිදු කර ඇති බවත්, 2 වන වගඋත්තරකරු විසින් තමා එලෙස පහර දීමක් සිදු කරන ලද බවට පිළිගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, 2වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය 2021.04.23 වන දින යාපනය ශික්ෂණ රෝහල වෙත ඇතුලත් වී ඇති බවත්, 2021.04.23 දින ඔහුව පරීක්ෂා කරනු ලැබූ වෛද්‍ය වී. ගජේන්තිනි යන වෛද්‍යවරිය විසින් මොට ආයුධයකින් සිදු ව ඇති බවට සැලකිය හැකි බරපතල නොවන තුවාල 9ක් දකුණු ඇස, වම් සහ දකුණු කළවා ආශ්‍රිතව ඇති බවට හඳුනාගෙන ඇති බවට අංක 1349/21 සහ 2021.04. 23 දිනැති අධිකරණ වාර්ථාව මගින් දක්වා ඇත. එකී තුවාල පිළිබඳව පහතින් දක්වා ඇත.

1.Abrasion over upper eye lid of right eye measuring 0.5 cm
2.Sub conjunctival hemorrhage of right eye
3. Abrasion over posterior surface of right side upper thigh measuring 1*1 cm
4.Trump line contusion over posterior surface of right side upper thigh measuring 7*1 cm
5.Trump line contusion over posterior surface of right side upper thigh measuring 7*1 cm
6.Trump line contusion over posterior surface of right side upper thigh measuring 7*4 cm
7.Trump line contusion over posterior surface of left side upper thigh measuring 9*1 cm
8. Trump line contusion over posterior surface of left side upper thigh measuring 9*1 cm
9. Trump line contusion over posterior surface of left side upper thigh measuring 9*1 cm

2 වන පැමිණිලිකරු විසින් 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් තමාට පහර දුන් බවට දැනුම් දුන් ශරීරයේ ස්ථාන සහ අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ තුවාල පවතින බවට දක්වා ඇති ස්ථාන එකිනෙකට අනුකූල බැවින් සහ වගඋත්තරකරුවන් විසින් 2 වන පැමිණිලිකරු පහර දීමක් සිදු කළ බවට පිළිගෙන ඇති බැවින් 2 වන පැමිණිලිකරු හට පහර දී තුවාල සිදු කිරිම සම්බන්ධයෙන් 1වන සහ 2වන වගඋත්තරකරුවන් වගකීමෙන් බැඳෙන බව තහවුරු වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්ථයක් ලෙස ගෙන සලකා බැලීමේ දී 1 වන වගඋත්තරකාරිය සහ 2 වන වගඋත්තරකරු විසින් 2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය හට පහර දීමක් සිදු කළ බවට පිළිගෙන ඇති බවත්, විනෝජන් සාම් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්ථාව තුළ ඔහුගේ ශරීරයේ බරපතළ නොවන තුවාල 9ක් ඇති බවට නිරීක්ෂණය වන බව සඳහන් ව ඇති බවත්, එකී තුවාල තිබෙන ස්ථාන, ඔහු හට පහර දීම් සිදු වූ ස්ථාන හා සැසඳෙන බවත් නිරීක්ෂණය වේ. එසේ හෙයින් 2 වන පැමිණිලිකරු වන විනෝජන් සාම් යන අය වධ හිංසාවකට ලක් වී ඇති බව තහවුරු වන

බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය වන මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව තුලින් සුරක්ෂිත කොට ඇති කිසිදු තැනැත්තෙකු වධහිංසා වලට හෝ කෲර අමානුශික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට ලක් නොකළ යුතුය, යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාරිය වන සන්ජිකා බාලසුබ්‍රමනියම් යන අය සහ 2 වන වගඋත්තරකරු වන පූජ්‍ය ඇන්ටන් අමලදාස් යන අය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. 1 වන හා 2 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රු.5,000 ක මුදලක් බැගින් රු.10,000 ක මුදලක් 2 වන පැමිණිළිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතුය.
2. මෙම සිද්ධිය සම්බන්ධයෙන් 1 වන සහ 2 වන වගඋත්තරකරුවන්ට එරෙහිව විනය පරීක්ෂණයන් පැවැත්වීමට අධ්‍යාපන ආමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු සිදු කළ යුතුය.

2024. 12 .24 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**පිටපත් :**

01. අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - දැනගැනීම සඳහා
02. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා